| 3D | එම .. .. | ආණ්ඩුව සහ සුදුහකුරුගේ කරමානිස් .. | එම .. | 0 | 1 | 23 |
| 51C | එම .. .. | එම .. .. | එම .. | 0 | 2 | 20 |
| 51D | එම .. .. | ආණ්ඩුව සහ සුදුහකුරුගේ අරෝනිසා .. | එම .. | 1 | 0 | 1 |
| 51F | එම .. .. | ආණ්ඩුව සහ සුදුහකුරුගේ කිරිත්තනා .. | එම .. | 1 | 0 | 2 |
| 51H | එම .. .. | ආණ්ඩුව සහ සුදුහකුරුගේ නොන්නෝ .. | එම .. | 1 | 0 | 5 |
| 51I | එම .. .. | ආණ්ඩුව සහ සුදුහකුරුගේ හිංගිරා .. | එම .. | 1 | 0 | 5 |
| 51AP | මිරිස්හේන .. .. | ආණ්ඩුව සහ නිකගොඩආරච්චිලගේ කිරිමැනිකේ .. | එම .. | 3 | 0 | 21 |
| 51AS | එම .. .. | ආණ්ඩුව සහ උඩකන්දේකංකානම්ලාගේ හේරත්හාමි | එම .. | 3 | 0 | 8* |
| 51BJ | තියඹරාගුලහේන්හේන .. | ආණ්ඩුව සහ හේවාගේ හිංගිරිහාමි .. | එම .. | 0 | 2 | 9 |
| 51BK | එම .. .. | ආණ්ඩුව සහ වැදිසිංහආරච්චිගේ එරෝනිස්අප්පු .. | එම .. | 0 | 2 | 3 |
| 51N | කිච්ලේහේන, ගලබඩකන්දේහේන, ඉඹුලහිටිහේන, හඳපාන්දෙනියේ හේන, මැඩලහහේන | ආණ්ඩුව සහ දෙන් හැන්රි විජේවර්ධන තෙන්න කෝන් බන්ඩාර මහත්මයා | එම .. | 54 | 2 | 12 |
| 51AD | හඳපාන්දෙනියේහේන .. | ආණ්ඩුව සහ නිකගොඩආරච්චිලගේ පොඩිමහත්මයා | එම .. | 7 | 0 | 25* |
| 51AJ | ලිඳකැපුහේන .. .. | ආණ්ඩුව සහ නාරසිංහලේකම්ලාගේ පොඩිනෝනා | එම .. | 1 | 2 | 16* |
| 51BE | උඩකුඹුරේහේන, තියඹරාගුලහේන, වැඩලන්හේන, ඉඹුලහිටිහේන | ආණ්ඩුව සහ වාප්පුසා මරික්කාර් හබීබු උම්මා .. | එම .. | 24 | 3 | 5 |
| 130 | උඩකුඹුරේහේන, පිල්ලගාවහේන, ඇල්ලපිටහේන, හල්ගහහේන, අටහවුලේහේන | ආණ්ඩුව සහ වාප්පුසා මරික්කාර් හබීබු උම්මා .. | එම .. | 29 | 2 | 7 |
| 152S | කොස්ගහහේන්යාය .. | ආණ්ඩුව සහ (1) සිලවන්සහිටිහාමිලාගේ හින්මහත්මයා, (2) එම මැණික්හාමි, (3) එම කිරිමැනිකේ, (4) එම හිංගිරි මහත්මයා, (5) එම හිංගිරිමැනිකේ | එම .. | 2 | 0 | 13 |
| 185G | දිගනේගොඩැල්ලේහේන .. | ආණ්ඩුව සහ විතානගේ දවිත්සිඤ්ඤො .. | එම .. | 2 | 0 | 3 |

* අක්කරයක තක්සේරු මිල රුපියල් 10ක් වේ.

අක්කරයක තක්සේරු මිල රුපියල් 150 දක්වා.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1932ක්වූ මැයි මස 9වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,185, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1932ක්වූ ජූනි මස 29වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට කිරිඇල්ලේ ගම්සභාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ කුකුළුකෝරළේ පල්ලේපත්තු කොටසෙහි පිහිටා තිබෙන බිම්කැබලි 27ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 42. ගම—අයගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 133B | නගාවැටුනහේන .. | ආණ්ඩුව සහ ගලතුරේ පදිංචි ගල්කොරුන්ගේ හාදෙව්චි .. | හේන .. | 0 | 2 | 5* |
| 190Z | මිටියෙලේහේන්යාය .. | ආණ්ඩුව සහ කලටුවානේ මැන්චි .. | හේ ඇත හේන .. | 1 | 0 | 2* |
| 215A | හිටමාකුවලගාවහේන්යාය | ආණ්ඩුව සහ යද්දෙහිරාලලාගේ පොඩිහාමි .. | එම .. | 0 | 2 | 2 |
| 233I | ඊරියගස්දෙනියේහේන | ආණ්ඩුව සහ පිටදෙනියේ පදිංචි (1) පිටදෙනියෙලාගේ නොන්නෝ, (2) එම පොඩිඅන්චි | හේන .. | 1 | 0 | 7 |
| 233M | එම .. | ආණ්ඩුව සහ කේ. ඒ. උපාරිස්සිඤ්ඤො .. .. | එම .. | 1 | 0 | 8 |
| 233N | එම .. | ආණ්ඩුව සහ මඩලගමගේ කොර්නේලිස් .. | එම .. | 0 | 2 | 9* |
| 395AA | යකාහටුගල .. | ආණ්ඩුව සහ ගෝනදූවේ පදිංචි ගමගේ සාදිරිස් පෙරේරා සේනානායක | ගල .. | 4 | 0 | 32† |
| 395AS | කෝපත්හේන .. | ආණ්ඩුව සහ කැලේමානගේ ලෙන්චා .. .. | හේන .. | 0 | 2 | 3‡ |
| 395BE | එම .. | ආණ්ඩුව සහ (1) තුඹුගලමුනසිංහගේ ලුවිස්සිඤ්ඤො, (2) පූගොවකන්කානන්ගේ චාර්ලස් අප්පුහාමි, (3) කපුවෙලගේ ඒබ්‍රහම්සිඤ්ඤො | එම .. | 6 | 0 | 11 |
| 483 | දලුක්ගලහේන්යාය .. | ආණ්ඩුව සහ කුච්චිකන්දේ පදිංචි උස්කන්දලාගේ තෙංල් නිසා | එම .. | 0 | 2 | 7* |
| 546A | කිරිමබුගොඩැල්ලේහේන | ආණ්ඩුව සහ අයගම පදිංචි මූරමුදියන්සෙලාගේ නෝනොහාමි | එම .. | 0 | 2 | 2* |
| 694P | ගලමුන්නේහේන්යාය . | ආණ්ඩුව සහ අයගම පදිංචි බෙරලියනවතුම්පුරගේ ජානිසා | එම .. | 2 | 0 | 8* |
| 694Q | එම .. | එම සහ එමගම පදිංචි එම පොඩියන්චියා .. | එම .. | 2 | 0 | 14* |
| 698A | කලුගලේහේන .. | ආණ්ඩුව සහ රත්නපුරේ බලංගෙදර වලව්වේ ඩබ්ලිව් ඊ. එල්ලාවල බාරේ ජී. ආර්. මුදලිහාමි | එම .. | 4 | 0 | 14* |
| 723B | මහාහේන .. | ආණ්ඩුව සහ අයගම පදිංචි ගම්මැද්දේමානගේ ගිරානිසා . | එම .. | 0 | 2 | 2 |
| 832M | ලුනුදෙනියේහේන .. | ආණ්ඩුව සහ ගලතුරේ පදිංචි කිරිඇල්ලේආරච්චිල්ලාගේ මුදලිහාමි | එම .. | 1 | 0 | 5* |
| 832P | රිලාගලපල්ලේහේන්යාය | ආණ්ඩුව සහ අයගම පදිංචි කැලේමානගේ එන්ජෙරිනා .. | එම .. | 0 | 2 | 4 |
| 832Q | එම .. | ආණ්ඩුව සහ ගවරාගිරිගේ පදිංචි මාත්‍රියාලාගේ හරමානිසා | එම .. | 0 | 2 | 6* |
| 832R | එම .. | ආණ්ඩුව සහ ගලතුරේකැලේමානගේ ලැසිසා .. | එම .. | 0 | 2 | 5* |
| 874A | දික්හේන .. | ආණ්ඩුව සහ අයගම පදිංචි එම සූටි .. .. | එම .. | 1 | 0 | 14* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 922Q | තිප්පොලේහේන්යාය . | ආණ්ඩුව සහ (1) ගලහිටියාලාගේ මහිමා, (2) එම සාදු, (3) එම සරදියා, (4) එම සන්දෙ, (5) එම රංගොච්චි සහ (6) එම පොරෝනිසා | හේන .. | 1 | 0 | 2* |
| 208A | ගොලුවපිබුහැරුස්සේ හේන | ආණ්ඩුව සහ මුරුගේසර් හැමුවෙල් සින්නතම්බි .. | එම .. | 2 | 0 | 25 |
| 213 | ගොලුවපිබුහැරුගෙසහේන්යාය | ආණ්ඩුව සහ එම .. .. .. | එම .. | 2 | 1 | 36 |
| 214 | හිටබාහුවලගාවහේන්යාය | එම .. .. .. | එම .. | 3 | 1 | 35 |
| 252AO | කුඩාඅරම්බේහේන්යාය, පිටදෙනිකන්දේහේන්යාය, කෙහෙල්වරුවේහේන | ආණ්ඩුව සහ මාතරආරච්චිල්ලාගේ දෙන් පොඩිසිංඤෝ අප්පුහාමි සහ කඹුරුවලකන්කානම්ලාගේ දෙන් දියෝනිස් ගුනතුන්ග | හේන සහ රබර් | 2 | 2 | 12 |
| 395R | බතලකොටුපේවහේන්යාය | ආණ්ඩුව සහ උක්වත්තේආරච්චිල්ලාගේ සිංගිරිමැනිකේ . | හේන .. | 1 | 2 | 6 |
| 395AH | කෝපත්හේන්යාය .. | ආණ්ඩුව සහ (1) නුහමුන්හේගමහැතිගේ පොඩිඅප්පුහාමි සහ (2) මහවඩආරච්චිල්ලාගේ පුංචිනෝනා හාමිනේ | හේන සහ රබර් . | 8 | 2 | 11* |

* අක්කරයක තක්සේරු මිල රුපියල් 10ක් වේ. † අක්කරයක තක්සේරු මිල රුපියල් 2·50ක් වේ.
‡ අක්කරයක තක්සේරු මිල රුපියල් 5ක් වේ.

අක්කරයක තක්සේරු මිල රුපියල් 150 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සරවෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1932ක්වූ මැයි මස 9වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඩී. බ්‍රෞන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,186, S. O.**—ඉඩම් බේරුම් කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1932ක්වූ ජූනි මස 30වෙනි දිනවූ බ්‍රහස්පතින්ද පෙරවරු 9ට කිරිඇල්ලේ ගම්සභාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුරේ පලාතේ කුකුළුකෝරළේ පල්ලේපත්තු කොටසගේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 42. ගම—ආඳගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 470H | දළුක්ගලේහේන .. | ආණ්ඩුව සහ ලේකම්ලාගේ පුංචිමැනිකේ .. .. | හේන .. | 0 | 2 | 5 |
| 630B | බඹහැලගේමූකලාන | ආණ්ඩුව සහ දෙන් විලියම් අංබවික්‍රම .. .. | එම .. | 13 | 1 | 19 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 150 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සරවෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1932ක්වූ මැයි මස 9වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඩී. බ්‍රෞන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,187, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1932ක්වූ ජූනි මස 30වෙනි දිනවූ බ්‍රහස්පතින්ද පෙරවරු 9ට කිරිඇල්ලේ ගම්සභාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ කුකුළුකෝරළේ පල්ලේපත්තු කොටසගේ පිහිටා තිබෙන බිම්කැබලි 10ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 224. ගම—පරගල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 190R | මකනගලේහේන්යාය | ආණ්ඩුව සහ (1) වතුකාරගේ බබාසිංඤෝ, (2) එම ගියනේරිසා | හේන .. | 4 | 0 | 17* |
| 257 | මහගුලනේහේන, හැරුස්හේන | ඩබ්ලිව්. ඩී. එඩ්වින් අප්පුහාමි .. .. | එම .. | 1 | 1 | 33 |
| 258 | ගල්පල්ලේබටහේන්යාය | ආණ්ඩුව සහ ඩබ්ලිව්. ඩී. එඩ්වින් අප්පුහාමි .. .. | එම .. | 20 | 3 | 2 |
| 68A | අඹුහේන .. | එම .. .. .. | එම .. | 2 | 0 | 9 |
| 273C | කිරිබෝරුකන්දේවත්තහේන | ආණ්ඩුව සහ ඩබ්ලිව්. ඩී. මතෙස් අප්පුහාමි සහ ඩබ්ලිව්. ඩී. සයිමන් අප්පුහාමි | එම .. | 2 | 0 | 13 |
| 337A | මැදහේන, අඹගහහේන | ආණ්ඩුව සහ දෙන් විබුර්තිරත්න විජේසිංහ .. | එම .. | 9 | 0 | 18 |
| 346O | නාවලහේන, කොහල්ලවලහේන | ආණ්ඩුව සහ පරගල විජේසුන්දරමුදියන්සෙලාගේ මද්දුම බන්ඩාර | එම .. | 13 | 2 | 15 |
| 129 | අතලහේකැලේවත්ත, පෙරියපැලවත්ත | හන්ගමුවේ ජෝන්සිංඤෝ, වතුකාරගේ කරමානිසා සහ තවත් කෙනෙක් විරුද්ධව අයිතිවාසිකම් කියයි | වත්ත .. | 1 | 0 | 11 |
| 142 | අඹගහවත්ත .. | හන්ගමුවේ පදිංචි ජෝන්සිංඤෝ, වතුකාරගේ ආගිරිසා විරුද්ධව අයිතිවාසිකම් කියයි | එම .. | 0 | 1 | 25 |
| 146 | ගල්ලෙනගාවවත්ත .. | එම .. .. .. | එම .. | 6 | 2 | 20 |

* අක්කරයක තක්සේරු මිල රුපියල් 10ක් වේ.

අක්කරයක තක්සේරු මිල රුපියල් 150 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සරවෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1932ක්වූ මැයි මස 9වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඩී. බ්‍රෞන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පුස්සල්ලාවේ ගෙසිලමට සොහොන් භූමියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියා කරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 9,199. ගම—නුවරඑළි පලාතේ කොත්මලේ කොටසේ රඹබොඩකෝරළේ හැල්බොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | බෙල්වාවත්ත .. | වර්පන්ටයින්ගස් වගාකර තිබෙන ඉඩම | හෙන්රි රෙජස් පුත්‍ර සමාගම, (ඒජන්තවරු කොළඹ බොසන්කුවැට් සමාගම) | 1 | 0 | 1·7 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ ජූනි මස 24වෙනි දින පස්වරු 2.30ත් කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ මැයි මස 9වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන්,
මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—උඩුවෙල උඩගමට සොහොන්භූමියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 9,181. ගම—පාතහේවාහැටේ උතුරු ගන්දහේකෝරළේ උඩුවෙල උඩගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ.ප. |
|---|---|---|---|---|
| 1 | ලූනුවැල්ලවත්ත .. | පතන (අත්හැර තිබෙන කෝපිවත්ත), අඹිපාරක් තිබේ | (1) මහනුවර හල්බඑවේ ඇන්සෝ හැරීස් මහතා, (2) මහනුවර ට්‍රිනිටි කොලීජියේ ප්‍රධාන ගුරුතුමා සහ (3) උඩුවෙල පන්සලේ කේ. බී. ධම්මානන්ද උන්නාන්සේ | 1 2 0 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ ජූනි මස 24වෙනි දින පස්වරු 2ත් කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ මැයි මස 9වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පුලෝලියේ ගම්සභා කොමිටියේ පාඩසාලාව පිහිටි බිම්කට්ටිය විසාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියි ආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. 8,033. ගම—නැගෙනහිර පුලෝලි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඉරඹිපිල්ලෙයිසීමා .. | තල්වත්ත .. | සිංගප්පූරුවේ වල්ලිපුරම් සෙල්ලෙයා .. .. | 0 0 14·1 |
| 1A | එම .. | මුඩුබිම .. | (1) වල්ලිපුරම්ගේ භාර්‍යා සින්නපුල්ලේ, (2) කාමූගේ භාර්‍යා පුල්ලේ, (3) ඒ. මුරුගේසුගේ භාර්‍යා කනකම්මා, (4) එස්. සිවරාසසින්ගම්, (5) සභාපතියේ භාර්‍යා පූරනම්, (6) සිනිවාසකම්ගේ දූ රත්තිනම් | 0 0 1·2 |
| 1B | එම .. | තල්වත්ත .. | සිංගප්පූරුවේ වල්ලිපුරම් සෙල්ලෙයා .. .. | 0 0 0·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ ජූනි මස 14වෙනි දින පෙරවරු 10ටත් කනිසමට පරුත්තිතුරේ රෙසිඩෙන්සියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. ඉඩම්වලට අයිතිවාසිකම් පෙන්වන ඔප්පුද ගෙනඑන්ට ඕනෑය.

වර්ෂ 1932ක්වූ මැයි මස 6වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ඒ. පී. ඩයිසන්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 114 (මාතලේ).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1932ක්වූ මැයි මස 13වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජයන්තක ඉඩමකැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණලබන බවද රජයන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1932ක්වූ අප්‍රේල් මස 6වෙනි දින මාතලේ කච්චේරියේදීය.

සී. ජී. ජෝන්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

(a) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු මාතලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

### උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ නැගෙණහිර කෝරළයේ මාතලේ පල්ලේසියපත්තුවේ කුරුවාව යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත දැක්වෙන බිම්කට්ටි, එනම්:—

මුල් සිතියමේ නො. 8,973.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | වරවිවෙවිහේන .. .. | 0 0 9 |
| 2 | එම .. .. | 0 2 27 |
| | | 0 2 36 |

මීට මායිම්—නැගෙණහිරට පී. අප්පුහාමි සහ තවත් අය අයිතිකම්කියන ගොඩකුඹුරේගෙදරවත්තද, කේ. අප්පුහාමි සහ තවත් අය අයිතිකම්කියන වරවිවෙවිවත්ත සහ ජේ. කෝන්හා සහ තවත් අය අයිතිකම්කියන ලෝන්විල්වත්තද; දකුණට මලකඹුර සහ බස්නාහිරට ගෙල්ලකාඑවේ සිට රත්තොටට යන පාරද.

## ටැණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම්.

### මින්නේරියේ ඉඩම් සශ්‍රීකකිරීමේ ව්‍යාපාරය.

පොළොන්නරුවට දකුණෙන් හැතැප්ම 12ක් පමණ ඈතින් පිහිටි මින්නේරිය වැවෙන් වතුර ලබාගෙන වැඩ කරන කුඹුරුකට්ටි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර වර්ෂ 1932ක්වූ ජූනි මස 11වන දින දක්වා භාරගනු ලබන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ. ඉල්ලුම්පත්‍ර ලියා අනුරාධපුරයේ උතුරු මධ්‍යම පලාතේ දිසාපති තුමාට යැවිය යුතුයි. ඉල්ලුම්කරුවන් විසින් එහි තමන්ගේ සම්පූර්ණ නම් හා තමන්ට ලියුම් ලැබෙන ක්‍රමය ලියයුතුයි. ඉඩම් කට්ටි ඉල්ලන අය තෝරීම පිණිස වර්ෂ 1932ක්වූ ජූනි මස 11වන දිනෙන් පසු ඉඩම් කච්චේරියක් හෝ කීපයක් පවත්වනු ලැබේ. මේ කච්චේරි පවත්වන තැන් දැනුම්දෙනු ලැබේ. කච්චේරියේ බැදීම පිණිස මුදලක් ඉල්ලුම්පත්‍ර සමග එවීම වුවමනා නැත.

2. බෙදදීම පිණිස ගොඩබිම් මඩබිම් දෙවගයම තිබේ. ඉඩම්කට්ටි දෙන්නේ පහත දක්වන පොරොන්දු පිටය :—

(1) අවසරපත්‍රය ලත් අය ඉඩම්කට්ටි ලබාගත් දින පටන් පස් අවුරුද්දක් ඇතුළත කුඹුරු අස්වද්දා ගොඩඉඩම් සශ්‍රීක කළයුතුයි.

(2) අවසරලත් අය වර්ෂයකට අක්කරයකට ශත 50 බැගින් වාර්ෂික බද්දක් කලින් ගෙවිය යුතුයි.

(3) අවසරලත් අය තුන් අවුරුද්දක් භුක්තිවින්දට පසු ආණ්ඩුවෙන් නියමකරන පරිදි අක්කරයකට රුපියල් 2කට මුලදී වැඩිනොවනසේ වතුර සැපයීම ගැන බද්දක් ගෙවීමට යටහත් වේ.

(4) තෝරාගත් එක් එක් ඉල්ලුම්කරුට දෙන බිම් ප්‍රමාණයද තෝරාගත් ඉල්ලුම්කරුවන්ට ඉඩම් කට්ටි වෙන්කරන අන්දමද ආණ්ඩුවේ දිසාපතිතැන විසින් නිශ්චය කරනුලැබේ; එසේ වෙන්කර දීම සම්බන්ධ සියලුම ප්‍රශ්නවලදී ඔහුගේ තීරණය අවසාන තීරණය වේ.

(5) දැනට පවතින හෝ මින්මතු නීති ප්‍රකාර පණවනුලබන හෝ වතුර සැපයීම හා ගොවිතැන්කිරීම සම්බන්ධ සියලුම ව්‍යවස්ථාවලට අවසරලත් අය යටහත් වේ.

(6) ඉඩමේ වැටවල් බැඳීම සඳහා හෝ ඉඩමේ මුරපැලවල් හෝ ගෙවල් තනාගැනීම සඳහා ඉඩමේ ලීදඬු ගැනීමට අවසරලත් අයට අයිතිවාසිකම් තිබේ. නමුත් අවසර නැතුව ඉඩමෙන් කිසිම දුවදඬු ආදියක් ඉවත ගෙන යාමට ඔහුට කිසි බලයක් නැත. ඒ සඳහා අවසර ගෙවීම නොගෙවීම සම්බන්ධව නිශ්චයකරගන්නා පොරොන්දු පිට දෙනුලැබේ.

(7) අවසරලත් අය අවසරපත්‍රයේ නියමවලින් යම් කිසිවක් ඉෂ්ට නොකළොත් හෝ එකී ඉඩමවත් අවසරලත් අයට ඉන් ඇති ඵල ප්‍රයෝජනයක්වත් අවසරලත් අයට විරුද්ධව පිටකරනලද ඇස්කිසියක් පිට තහනමට ගත්තොත් හෝ අවසරය අවලංගුකරන්නටද ඉඩම හා එහි තිබෙන යම් අස්වැන්නක්, වගාවක්, ගොඩනැගිල්ලක් හෝ වෙනයම් දියුණුවක් තම අත්අඩංගුවට ගන්නටද ආණ්ඩුවේ දිසාපතිතැනට පුළුවන. එපමණක්ද නොව අවසරලත් අය හෝ වෙනයම් කිසි කෙනෙකු විසින් ඒ ඉඩමෙහි කරනලද යම් දියුණුවක් සඳහාවූ පාඩුව ගැන අවසරලත් අයටවත් ඔහු වෙනුවෙන් අයිතිවාසිකම් කියන වෙනයම් කෙනෙකුටවත් අලාභයක් ඉල්ලන්නට කිසිම අයිතිවාසිකමක් නැත.

(8) අවසරලත් අයට වෙන්කොට දුන් ඉඩමෙන් පාරවල් ඇළවල් හෝ වෙනයම් කටයුත්තක් සඳහා මින්මතු ආණ්ඩුවට වුවමනාකරන යම් කොටසක් ඇත්නම් එය වන්දි ගෙවිල්ලක් නොලබා භාරදිය යුතුයි.

(9) ඉහත (1) වන නියෝගයෙහි සඳහන්වූ පස් අවුරුදු කාලය අවසානයේදී අවසරලත් අය ආණ්ඩුවේ දිසාපතිතැන මැනවැයි පිළිගන්නා පරිදි ඉඩම සශ්‍රීක කොට තිබුණිනම්, ඔහුට පහත දක්වන නියම පිට ඉඩම දෙනුලැබේ :—

(*a*) ආණ්ඩුවට සුළු මුදලක් අවුරුදු පතා ගෙවිය යුතුයි. නැති සුළු මුදලක් නැතහොත් කොටස් වශයෙන් අවුරුදු කීපයකදී ගෙවීය යුතුයි.

(*b*) අවසර නැතුව ඉඩම අන්සන්තක හෝ උකස්කළ නොහැකිය.

(*c*) ඉඩම ණය ගැන විකිණිය නොහැකිය.

(*d*) ඉඩමේ වැව්ලි කළයුතුය.

(*e*) ඉඩම එක්තරා නියම ප්‍රමාණයකට අඩුවෙනසේ කොටස් කළයුතු හෝ අයවලුන් එක්තරා ගණනකට වැඩියෙන් පොදුවේ තබාගැනීමට ඉඩදිය හැකි හෝ නොවේ.

සී. වී. බ්‍රෙන්,
ඉඩම් කොමසාරිස් තැන.

වර්ෂ 1932ක්වූ මැයි මස 9වෙනි
දින කොළඹදීය.

### තණකැපීම පිණිස බදුදෙන ඉඩම්.

මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව වර්ෂ 1932ක්වූ ජූනි මස 1වෙනි දින සිට එක් අවුරුදු හයමාසයකට පහත සඳහන් ඉඩමේ තණකොළවල බද්ද මිලේට ගැනීම පිණිස එවනුලබන ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නවා ඇත.

සීල්තබා එවනුලබන ඉල්ලුම්පත්‍ර වර්ෂ 1932ක්වූ මැයි මස 30වෙනිදා දවල් 1 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එම වේලාවට කඩාබලනු ලැබේ. ඉල්ලුම්පත්‍ර එවනුලබන සියලුදෙනාම එම ඉල්ලුම්පත්‍ර සැබෑවූ ඒවා බව ඒජන්ත උන්නාන්සේට ඒත්තුගැනීම පිණිස තමන් හෝ තමන් වෙනුවෙන් ඊට නිසි බලයලත් අයෙක් එම වේලාවට පෙණීසිටින්ට ඕනෑය.

1. බදුමිල සම්පූර්ණයෙන් වෙන්දේසි දවසේදීම ගෙවිය යුතුයි.

2. මිලේටගත් අයගේ අයිතිවාසිකම තණකොළ ප්‍රයෝජනය පමණකි.

3. මිලේටගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් විසින් හෝ කිසිම ගසක් කැපීම හෝ වැටක් හෝ මායිමක් වෙනස්කිරීම තහනම්ය.

4. මිලේට්ගත් අය විසින් එම ඉඩම යහපත්ලෙස පිරිසිදුව තබාගතයුතුවා පමණක්නොව නාගරික සභාවේ අණපණත්වලට එකඟව ක්‍රියාකළ යුතුයි.

5. කිරිඑළදෙනුන්ට, මීදෙනුන්ට හෝ මීහරකුන්ට තණ කෑමට අවකාශ දියයුතු නොවේ. එසේ තණකෑමට ඉඩහරිනු ලැබූ සතුන් ඇල්ලීමට බදු දීමනාකාරයාට හෝ එතුමාගෙන් නිසි බලයලත් අයෙකුට අවසර තිබේ.

6. තණකෑවීමට ඉඩහරිනුලැබූ සතුන් මහපාරේ දඩාවතේ නොයනලෙස වගබලාගත යුතුයි.

7. මේ ඉඩමේ සවස 6.30 සිට උදේ 6 දක්වා හරක්ට තණ කෑම පිණිස ලිහාදමන්ට හෝ බැඳතියන්ටවත් අවසර නැත.

8. බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ අවසර ඇති ලියවිල්ලක් නොමැතිව එම බද්ද වෙන කෙනෙකුට පවරාදීම හෝ විකිණීම හෝ කොටස්කිරීම තහනම්ය.

9. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් එම ඉඩම්වල වැටවල් බඳින්ට නියමකළොත් මිලේටගත් අය විසින් එසේ කළයුතුය.

10. බද්ද අවසාන වෙන්ට පෙර එම ඉඩම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ආණ්ඩුවට උවමනාකළොත් සතියක් කල් ඇතුව ලියවිල්ලකින් දැනුම්දුන්පිට ආණ්ඩුවට භාරදිය යුතුයි. ආණ්ඩුව විසින් භුක්තිය භාරගනුලැබූ ඉඩම් කට්ටියේ හෝ ඉඩම්වල ඉතිරි බදුකාලයට වැටෙන බදු මුදල නැවත මිලේටගත් අයට ගෙවනවා ඇත.

11. මෙම ඉඩමේ තණකොළ වැවීම තහනම්.

12. ඉහතකී කොන්දේසි කඩකළොත් එම ඉඩම්වල භුක්තිය භාරගෙන මිලේටගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් එම ඉඩම්වලින් අස්කිරීමට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

13. එක ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ආර්. ඇම්. ඇම්. වර්ස්ලි,
බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත
උන්නාන්සේ වම්හ.

වර්ෂ 1932ක්වූ මැයි මස 10වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

නොම්බර 17,149 දරණ ප්ලෑන් එකේ පෙන්නුම්කර තියෙන අක්කර හතරක් පමණ විශාලකම ඇති බිම්කට්ටි 1 සහ 2න් කෑල්ලක්.

---

### "කාක්දූවේ" බද්ද.

කැළණිගං මෝයේ පිහිටි "කාක්දූව" කියන ඉඩමේ වර්ෂ 1932ක්වූ මැයි මස 1වෙනි දින සිට අවුරුදු එකහමාරක බද්ද මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මිලේට ගැනීම පිණිස එවනුලබන සීල්තබනලද ඉල්ලුම්පත්‍ර බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්ට යෙදෙන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

යථොක්ත ඉල්ලුම්පත්‍ර වර්ෂ 1932ක්වූ මැයි මස 30වෙනි සඳුදා දවල් 1ක වනතුරු භාරගෙණ එදින එකී වේලාවට කඩාබලනවා ඇත. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරවල පිට "කාක්දූවේ බද්ද ගැන ඉල්ලුම්පත්‍රය" කියා සඳහන්කළ

යුතුයි. ඉල්ලුම්පත්‍ර සැබෑබව ඔප්පුකිරීම පිණිස ඉල්ලුම්කරන් නාඩු සියල්ලෙදනාම තම තමන්ම හෝ තමන් වෙනුවට ක්‍රියා කරන්නෙක් ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ පෙනීසිටින්ට ඕනෑය.

වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලුම්කොට ලබා ගතහැක.

ආර්. ඈම්. ඈම්. වර්ස්ලි,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත
උන්නාන්සේ වෙනුව.

වර්ෂ 1931ක්වූ මැයි මස 10වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

කොන්දේසි.

1. "කාක්දූව" කියන ඉඩමේ බද්ද මිළයට ගැනීම වර්ෂ 1932ක්වූ මැයි මස 1වෙනි දින සිට අවුරුදු එකහමාරකට පමණය.

2. මිලේටගත් අය විසින් අවුරුද්දක මුදල විකිණීමේ දිනදී ගෙවිය යුතුය.

3. ඉඩමේ සිටිටි ගහකොළවල සහ ගොඩනැගිලි ආදියක් ඇත්නම් ඒවා භුක්තිවිඳීමට මිලේටගත් අයට බලය තිබේ.

4. මිලේටගත් අයට හෝ ඔහුගේ වැඩකරුවන්ට කිසිම ගහක් කපන්ටවත් වැටක්, මායිමක් හෝ ගොඩනැගිලි ආදියක් වෙනස්කරන්ටවත් අවසර නැත.

5. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බදුගන්නාලද ඉඩමේ වැටක් බඳින්ට කියා අණකළොත් බදුගැනුම්කාරයා විසින් කළයුතුයි.

6. බදුගැනුම්කාරයා විසින් ඉඩම ශුද්ධපවිත්‍ර ලෙස තබාගන්ටත්, සියලුම අයබදු ගෙවන්ටත්, නාගරික සභාවේ අණපණත් පරිදි ක්‍රියාකරන්ටත් ඕනෑය.

7. ඒජන්ත උන්නාන්සේට හෝ උන්නාන්සේගේ අණ පරිදි ක්‍රියාකරන්නෙකුට ඕනෑවිටකදී බදුකාරයාට මාසයක් කල්දී නැවත ඉඩමේ භුක්තිය භාරගැනීමට බලය තිබේ.

8. ඒජන්ත උන්නාන්සේගේ කැමැත්ත සහිත ලියවිල්ලක් නැතුව බදුකාරයා විසින් අන්කෙනෙකුට බද්ද පවරාදීම හෝ විකිණීම තහනම්ය.

9. ඉඩමේ පිහිටි පොල්ගස් මහරුවට හෝ මීරුවට මැදීමට බදුකාරයා විසින් අවකාශ දියයුතු නොවේ.

10. සම්පූර්ණ ඉඩම හෝ ඉන් කොටසක් බද්ද අවසාන වෙන්ට ප්‍රථම ආණ්ඩුවට ඕනෑකළොත් මාසයක් කල්දුන්විට ආණ්ඩුවට භාරදිය යුතුයි. බදු මුදල් ගෙවා ඉතිරිවූ බදු කාලයේ හැටියට ලැබියයුතු මුදල බදු ගැනුම්කාරයාට ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

11. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට එම කාලය ඇතුළත සුදුසු වේලාවලදී ඉඩමේ තත්වය පරීක්ෂාකර බැලීම සඳහා ඉඩමට ඇතුල්වීමට බදුකාරයා විසින් අවසරදිය යුතුයි.

12. බදු ගැනුම්කාරයා විසින් ඉඩමේ තිබෙන ලකුණු කුළුණු හෝ අගල් ආදිය වෙනස් නොකරණ හැටියට වගබලා ගතයුතුයි.

13. ඉහත සඳහන් කොන්දේසි කඩකළොත් කිසිම මුදලක් නොගෙවා බදුගැනුම්කාරයා හෝ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අස්කර නැවත භුක්තිය භාරගැනීමට ඒජන්ත උන්නාන්සේට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.

14. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේපකිරීමට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

මෙහි පහත සඳහන්වෙන පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කුවල පාලම් සහ ඇලරේන්ද වර්ෂ 1932ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1933ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දිනා දක්වා දොළොස් මාසයකට ආණ්ඩුවෙන් බදුගැනීමට එවන ලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. පෙරකී මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මතුපිට හෙවත් ඇන්විලොප් උඩ "Tender for Toll Rents" රේන්ද සඳහා ඉල්ලුම්පත්‍ර යන වාසගම ඇතුව වර්ෂ 1932ක්වූ ජූනි මස 1වෙනි දින සවස 3ට පුත්තලම් කච්චේරියේදී භාරගනු ලැබේ. ඉල්ලුම්කාරයෝම පෙනීසිට ඔවුන්ගේම අතින් ඉල්ලුම්පත්‍ර භාරදෙන්ට ඕනෑය. තැපැල් මගින් එවනලද ඉල්ලුම්පත්‍ර හෝ ඉහත පෙනෙන වේලාවට පසු එවනලද ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

3. ඒ ඒ රේන්දපලවල්වලට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර දෙන්ට ඕනෑය.

4. උප ඒජන්ත උන්නාන්සේ විසින් උතුමාණන්වහන්සේ වෙත ඔප්පුකර සිටීමට තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනින් දහයෙන් කොටසකට වැටගෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇප තබන්ට ඕනෑවා පමණක්නොව එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්ට යෙදුනිනම් ඒ බව දන්වමින් දින සිට 30 දවසක් ඇතුළතදී එම ඉල්ලූ ගණනින් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් කොටසකට වටිනා ඇප මුදලෙන් හෝ තබා සම්පූර්ණකරන්ට ඕනෑය.

5. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීමට සහ ඔප්පුවල සඳහන් ඇප ඉඩම් ගැන අදහස ප්‍රකාශකිරීමටද ආණ්ඩුවේ පෙරකදෝරු උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුද, එසේම ඇප ඔප්පු ලිවීමට සහ ඒවා සම්පූර්ණකිරීමටද වර්ෂ 1919යේ නො. 10යේ රෙගුලාසිය යටතේ ගෙවියයුතු ඔප්පුවලට මුද්දර ගාස්තුද යන සියල්ලම ගෙවීම පිණිස මුදල් බඳින්ට ඕනෑය.

6. ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු, ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියා පදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබා ගත යුතුයි. මේ සහතිකපත්‍ර ලබාගැනීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින්ම දැරියයුතුයි.

7. කිසිම නොහොත් සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රශ්න නොකර එපාකිරීමට බලයක් උප ඒජන්ත උන්නාන්සේට තබාගනු ලැබේ.

වැඩිදුර කාරණා පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගත හැක.

ඇල රේන්ද.

| | | |
|---|---|---|
| 1. නාත්තන්ඩිය | 2. චූනකිපිරවු | 3. පාලාවිය |

තොටුපල් රේන්ද.

| | |
|---|---|
| 1. පුත්තලම ඒකාලේ | 4. කල්පිටිය මුටුවෝල් |
| 2. පුත්තලම් කල්පිටිය | 5. හලාවත මුටුවෝල් |
| 3. කල්පිටිය කරතිව් | |

වී. කුමාරස්වාමි,
පුත්තලම් හලාවත දිස්ත්‍රික්කවල
ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1932ක්වූ මැයි මස 11වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

---

අන්‍ය දැන්වීම.

කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑකෝරළේ උඩුගහපත්තුවේ පස්යාලේ පදිංචි දොන් ආර්නොලිස් සමරකෝන් යන මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩකරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හැටියට පත්කරනු ලබන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගියතැනදී රෙජිස්ට්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලුම්කරන බව වර්ෂ 1907යේ අංක 1 දරන ආඥාපණතේ 1 B දරන උප ලේඛනයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දන්වමි.

3 මාර්තු 1932. ඩී. ඒ. සමරකෝන්.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.